# ඔබ කැපී පෙනෙන්නට සූදානම්ද?

*Victoria Police හට දැන් ඔබව අවශ්‍යවේ. අප සතුව විවිධ ආකාරයේ අභියෝගාත්මක තනතුරු ඇත. ඔබට උනන්දුව ඇති තනතුර තෝරා ගන්න…*



***පොලිස් සාමාජිකයන්***
*පොලිස් රාජකාරි යනු අභියෝගාත්මක මෙන්ම ප්‍රතිඵල ලබාදෙන වෘත්තීයකි. එය අති විශේෂ රාජකාරියක් වන්නේ ආරක්ෂාකාරීව සහ සුරක්ෂිතව සිය ජීවිත පවත්වා ගැනීමට සියළු වික්ටෝරියානුවන් හට ඔබ විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන බැවිනි.*



***ආරක්ෂක සේවා නිලධාරීන්***
*ඔවුන් විසින් අපගේ වර්ධනය වන දුම්රිය පද්ධතිය හට දිගින් දිගටම සහාය ලබාදේ. දිනපතා දුම්රිය සේවාව උපයෝගී කර ගන්නා 400,000 පමණ දෙනෙකු ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔබ සම්බන්ධවේ.*



***වික්ටෝරියානු රාජ්‍ය සේවාව***
*Victoria Police හට අත්‍යාවශ්‍ය සහාය ලබාදෙන විවිධ ආකාරයේ අභියෝගාත්මක තනතුරු ලබාදෙන Victoria Police මගින් වික්ටෝරියා ප්‍රාන්තය පුරා 3000කට අධික සහායක කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇත.*

**VICTORIA POLICE සාමාජිකයෙකු හෝ ආරක්ෂණ සේවා නිලධාරියෙටකු වීම සඳහා ඔබ විසින් පහත දේ කල යුතුයඃ**

- වයස අවුරුදු 18 හෝ එයට වැඩිවීම
- ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ඕස්ට්‍රේලියානු නිත්‍ය වැසියෙකු වීම
- ඔබ වයස අවුරුදු 21ට අඩුනම්, ඔබ විසින් වික්ටෝරියානු අධ්‍යාපන සහතිකය (VCE) හෝ ඒ හා සමාන සුදුසුකමක් (ව්‍යවහාරික ඉගෙනීම පිළිබඳ ජ්‍යෂ්ඨ මට්ටමේ වික්ටෝරියානු සහතිකය (VCAL) සමත්ව තිබීම.
- අපරාධ සහ රථවාහන වැරදි සම්බන්ධ අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම
- ඇස් පෙනීමට අදාල අවශ්‍යතා සපුරා තිබීම. ඔබ සුදුසුද යන්න සොයා බැලීම සඳහා පළාතේ දෘෂ්ඨි විශේෂඥ හමුවන්න
- අවධානාත්මක සහ ශාරීරික වශයෙන් අභියෝගාත්මක රාජකාරී කිරීම සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යවීම

ඉහත ඇති සුදුසුකම්වලට අමතරව, පොලිස් සාමාජිකයන් හට වික්ටෝරියානු මැනුවල් වාහන පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය.

**අපගේ වටිනාකම්**
Victoria Police විසින් ප්‍රජාවගේ සැලකිය යුතු විශ්වාසය සහ ඔවුන්ගේ තෘප්තිය භුක්ති විඳී. අපගේ සියළුම ජනතාව අපගේ මූලික වටිනාකම් අනුව කටයුතු කරන බවට වගබලා ගැනීමට අප ඇපකැපවී සිටිමුඃ

සියළුම සාමාජිකයන් තුල පහත මූලික වටිනාකම් ඇතිවීම අත්‍යාවශ්‍යවේඃ
**අවංකභාවය**
**නායකත්වය**
**සුනම්‍යභාවය**
**ගෞරවනීයබව**
**උපකාරශීලිබව**
**වෘත්තීයමයබව**

**නිවාඩු**
පොලිස් සාමාජිකයෙකු හෝ ආරක්ෂණ සේවා නිලධාරියෙකු වශයෙන් උපාධිය ලැබීමෙන් පසු, ඔබට හිමි නිවාඩු හිමිකම් වන්නේ.

- වසරකට විනෝදය සඳහා සති හතක නිවාඩු සහ අමතර දින 10ක එකතුවූ නිවාඩු.
- වසරකට දින 15ක් අසනීප නිවාඩු.
- මාතෘ සහ පීතෘ සහ අධ්‍යයන නිවාඩු ඇතුළු වෙනත් පහසු ආකාරයේ නිවාඩු හිමිකම්.



**පොලිස් සාමාජිකයන්**

**Victoria Police සාමාජිකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් ඔබ හට ඇතිද?**
ඔබට ඔබ ජීවත්වන ප්‍රජාවට සේවයක් කිරීමේ අවශ්‍ය දිරිය, ආශාව සහ උනන්දුව ඇතිනම්, ඔබගෙන් විමසීමක් ලැබීමට අපි සතුටින් සිටිම

පොලිස් රාජකාරි යනු අභියෝගාත්මක මෙන්ම ප්‍රතිඵල ලබාදෙන වෘත්තීයකි. එය අති විශේෂ රාජකාරියක් වන්නේ ආරක්ෂාකාරීව සහ සුරක්ෂිතව සිය ජීවිත පවත්වා ගැනීමට සියළු වික්ටෝරියානුවන් හට ඔබ විසින් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන බැවිනි.

අප සොයන්නේ ඔබවද? වික්ටෝරියාව පුරා අපගේ විවිධාකාරීවූ ප්‍රජාව පිළිබිඹු කරන ආකාරයට කාන්තාවන් සහ පිරිමින් බඳවා ගැනීමට අපට අවශ්‍යවේ.

ඔබ සම්බන්ධ වැඩිදුර ඉගෙනීමට සහ Victoria Police සාමාජිකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් ඔබහට ඇතිද යන්න සොයා ගැනීම සඳහා අපගේ වෙබ්අඩවිය වෙත ගොස් අපගේ මාර්ගගත සුදුසුකම් සහ යෝග්‍යතා පරීක්ෂණය කරන්න.

**පැය ගණන**
Victoria Police මගින් පැය 24ක සහ සතියට දින හතක සේවාවක් ලබාදේ. කොස්තාපල්වරයෙකු වශයෙන් සති අන්ත, රාත්‍රී, ප්‍රසිද්ධ නිවාඩු දින සහ විවිධ ස්ථානවල විවිධ ආකාරයේ වැඩ මුර කිරීමට අවශ්‍යවේ. පූර්ණ කාල සාමාජිකයන් සඳහා සාමාන්‍ය වැඩ කලයුතු ප්‍රමාණය වන්නේ සතිදෙකකට පැය 80කි.

**පුහුණුව**
Victoria Police Academy හි පොලිස් බඳවා ගැනීමේ පුහුණුව කල පසු පොලිස් ආරක්ෂාව ලබාදීම යනු කුමක්ද යන්න ඔබ විසින් අත්විදිනු ඇත. මෙම සති 33 පුහුණු පාඨමාලාව සැලසුම්කර ඇත්තේ ඔබ එදිනෙදා ජීවිතයේ පාරිවාසික කොස්තාපල්වරයෙකු වශයෙන් මෙහෙයුම් රාජකාරි කරන විට ඔබට අවශ්‍ය දැනුම, නිපුණතා සහ විශ්වාසය ලබාදීමටය.

පාරිවාසික කොස්තාපල්වරයෙකු වශයෙන් උපාධිය ලැබීමට ඔබ විසින් සියළුම පුහුණු කටයුතුවල සුදුසුකම් ලැබිය යුතු අතර ඔබ හට කාර්යක්ෂම Victoria Police සාමාජිකයෙකු වීමට අවශ්‍ය පුද්ගලික ගුණාංග, මානසික මට්ටම සහ ආකල්ප ඇති බව දැක්විය යුතුය.

**ඇකඩමියෙන් පසු**
උපාධිය ලබා ගැනීමෙන් පසු ඔබගේ පාරිවාසික පුහුණුව සම්පූර්ණ කිරීමට කැමති නාගරික ප්‍රදේශ තුනක් නම් කිරීමට ඔබගෙන් ඉල්ලා සිටිනු ඇත. කෙසේවුවද ඔබව ප්‍රාදේශීය ස්ථානයන් ඇතුළුව වික්ටෝරියා තුල ඕනෑම ස්ථානයක රාජකාරී කිරීමට සිදුවිය හැකිය.

**අයදුම් කරන්න**
ඔබ විසින් අපගේ මූලික සුදුසුකම් සපුරා ඇති බවට තීරණය කර සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට සිටි පසු, ඔබ විසින් Victoria Police සාමාජිකයෙකු වීමට අදාල මීළඟ පියවර වන අභියෝගාත්මක රැකියාවක් ඇරඹීමට සූදානම්ය.



**ආරක්ෂක සේවා නිලධාරීන්**

**ඔබ විසින් ප්‍රජාව ආරක්ෂා කරන සහ ප්‍රජාවෙහි වෙනස්කම් කරන අයෙකු වශයෙන් ඔබව දකින්නේද?**

දැනට වික්ටෝරියා ප්‍රාන්තයේ වැදගත් ප්‍රජා සේවා තනතුරු සඳහා Victoria Police මගින් අපේක්ෂකයන් සොයමින් සිටී.

ආරක්ෂක සේවා නිලධාරියෙකු වශයෙන්, අපගේ දුම්රිය පද්ධතිය දිනපතා භාවිතා කරන සේවාදායකයන් 400,000ක් ආරක්ෂා කිරීමට ඔබ උපකාර කරනු ඇත.

ඔබගේ රැකියාවේ අවධානය ඇත්තේ මහජනතාවගේ සාමාන්‍ය විමසීම් සම්බන්ධයෙන් උපකාර කිරීම, උපදෙස් ලබාදීම සහ ප්‍රජාව හට ආරක්ෂාව ඇති බවට තහවුරු කිරීමවේ. මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ සහ දේපළවලට කරන හානි ඇතුළු සමාජ විරෝධී හැසිරීම සම්බන්ධ සිද්ධි සම්බන්ධයෙන්ද කටයුතු කිරීමට ඔබට සිදුවනු ඇත.

**පැය ගණන**
දුම්රිය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක සේවා නිලධාරීන් පැය අටේ, නමයේ හෝ දහයේ සේවා මුරවල නිරතවනු ඇත. තමාට ලබාදෙන දුම්රිය ස්ථානයට ප.ව. 6ට යාම අවශ්‍යවන අතර අවසාන දුම්රිය පිටත්වන තෙක් සිටිය යුතුය.

රාජකාරී කරන සමහර වේලාවල ඔබගේ මූලික වැටුපට අමතරව වැඩමුර දීමනාද ඇතුලත්වේ.

පුහුණුව
Glen Waverley හි Victoria Police Academy හි සති 12ක පුහුණු පාඨමාලාවක් ඔබ විසින් ආරම්භ කරනු ඇත. ඔබ විසින් මෙම පුහුණුව සඳහා සඳුදා සිට සිකුරාදා දක්වා පෙව 7.30 සිට පව 4.10 දක්වා සහභාගි විය යුතුය.

PSO පුහුණුව මගින් සාමාජිකයන් හට පුළුල් පරිසරයක අනපේක්ෂිත ඉහළ තත්වයන් හට මුහුණ දී ආරක්ෂාකාරීව කටයුතු කිරීමට සූදානම් කෙරේ.

ඔබ විසින් පොලිස් සාමාජිකයෙකු මෙන්ම සමාන ගිනි ආයුධ සහ ආරක්ෂක උපායන් ඉගෙන ගන්නා අතර නිවෙස් නැති, තරුණ, මත්පැන් සහ මත් ද්‍රව්‍ය මගින් බලපෑම් ඇතිවූ පුද්ගලයන්, වයසක අය සහ මානසික අසනීප සමග ජීවත්වන අය වැනි ගොදුරුවිය හැකි අය හට ගරු කරන ආකාරයද ඉගෙන ගනු ඇත.

**ඇකඩමියෙන් පසු**
සති 12ක පුහුණු පාඨමාලාව අවසානයේ ඔබ ආරක්ෂණ සේවා නිලධාරියෙකු වශයෙන් උපාධිය ලබාගත් පසු, Victoria Police Academy හි ඔබ හට උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ඇත.

ආරම්භයේදී Footscray, North Melbourne, Clifton Hill සහ Richmond ඇතුළු සිටි ලූප් දුම්රිය ස්ථාන සහ සෙන්ට්‍රල් හබ් දුම්රිය ස්ථානවල සේවයේ යොදවනු ඇත. ඔබට දිගින් දිගට ලබාදෙන පුහුණුවේ කොටසක් වශයෙන් ඔබට ට්‍රාන්සිට් පොලීසිය මගින් සහාය ලබාදෙන අතර අවසානයේ තවත් ප්‍රදේශවලට ඔබව අනුයුක්ත කරනු ඇත.

**අයදුම්කිරීම**
ඔබට ආරක්ෂකා සේවා නිලධාරියෙකු වීමට අවශ්‍ය සුදුසුකම් ඇතිද යන්න තීරණය කිරීම සඳහා Victoria Police රැකීරක්ෂා වෙබ් අඩවිය වන policecareer.vic.gov.au/pso හි සුදුසුකම් විභාගය කරන්න.



**වික්ටෝරියානු රාජ්‍ය සේවය**

ඔබ පොලීසිය ගැන සිතන විට ඔබ සිතන්නේ ප්‍රජාව තුල සිටින පොලිස් සාමාජිකයන් සම්බන්ධයෙනි. කෙසේවුවද Victoria Police මගින් සහායක තනතුරුවල දහස් ගණන් අයව සේවයේ යොදවා ඇති අතර ඔබට මෙවැනි රැකියාවක් තිබිය හැකිය.

විවිධ ආකාරයේ රැකියා Victoria Police සතුව ඇති අතර ඒ මගින් සංවිධානයේ අධිකරණ වෛද්‍ය සිට මාධ්‍යය සහ තොරතුරු තාක්ෂණය ආදී විවිධ අවශ්‍යතාවයන් නිරූපණයවේ.

පහත ඇතුළු ක්ෂේත්‍රවල අවස්ථා ඇත:
- මූල්‍ය සහ සම්පාදනය
- මානව සම්පත් කළමණාකරණය
- තොරතුරු තාක්ෂණය
- සාමාන්‍ය පරිපාලනය
- පර්යේෂණ, උපාය කළමණාකරණය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය
- ඇඟිලි සළකුණු විශේෂඥ, විශ්ලේෂක සහ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්

විශාල සංවිධානයක රාජකාරී කිරීමේ ඇති එක වාසියක් නම් විවිධ ව්‍යාපාර ඒකකවල වැඩකිරීම, විවිධ ක්ෂේත්‍රවල රාජකාරීවලට සහ නිපුණතාවයන් හට නිරාවරණය වීම.

Victoria Police මගින් කාර්ය මණ්ඩලය හට රැකියා වැඩිදියුණු කිරීමට සහ විවිධ ක්ෂේත්‍රවල විවිධ නිපුණතාවල යෙදීමට අවස්ථා ලබාදේ. වික්ටෝරියාවේ එක අන්තයක සිට අනෙක් අන්තයට නාගරික සහ ප්‍රාදේශීය ප්‍රදේශවල රැකියා අවස්ථා ඇත.

Victoria Police යනු සමාන අවස්ථා ලබාදෙන සේවායෝජකයෙකි.

**අප ලබාදෙන දේ**
ඔබ Victoria Police හි කොටසක් යනුවෙන් අදහස්වන්නේ ඔබ හට ප්‍රජාව හට දායකත්වය ලබාදීමට සහ ප්‍රජාවේ වෙනසක් ඇති කිරීමට අවස්ථාව ඇති බවයි. අප පහත දේ කිරීමට අපගේ සහකරුවන් සමඟ කටයුතු කරන අතරතුර අපගේ අරමුණ වන වඩා ආරක්ෂාකාරී වික්ටෝරියාවක් ඇතිකිරීමට ඔබ විසින් අප හට උපකාර කෙරේ:

- නීතිය ක්‍රියාත්මක කිරීම මගින් ආරක්ෂාකාරී සහ වඩා සුරක්ෂිත සමාජයක් තහවුරු කිරීම
- අපරාධ විමර්ශණය කිරීම සහ වැරදිකරුවන් හට නඩු පැවරීම
- ප්‍රජා උපකාර සහ අධ්‍යාපනය ලබාදීම
- අපරාධ වැළැක්වීම පිළිබඳ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම
- වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන සහ පළාතේ ප්‍රජාව සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

Victoria Police සමඟ කටයුතු කරන රාජ්‍ය සේවා නිලධාරියෙකු වශයෙන් සංවිධානයේ උපායමාර්ගික ආරම්භනයන් ක්‍රියාත්මක කිරීමට සහ ඒ සඳහා සහාය ලබා දීමට ඔබ විසින් උපකාර ලබාදේ. ඔබට මෙය කල හැක්කේ වඩා ආරක්ෂාකාරී වික්ටෝරියාවක් ඇති කිරීම සඳහා ඉදිරිපෙළ කටයුතු කරන පොලිස් සාමාජිකයන් හට එදිනෙදා ක්‍රියාකාරකම් කිරීමට අවශ්‍ය සම්පත් ලබාදීමට උපකාර ලබාදීම මගින්.

ඕස්ට්‍රේලියානු රජය සහ කදිම සංවිධානයක් වන Victoria Police සමඟ රාජකාරී කිරීම මගින් ඔබ හට වෙනත් බොහෝ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබිය හැකිය.

**අයදුම්කිරීම**

Victoria Police සඳහා සියළුම තනතුරු ප්‍රචාරය කරන්නේ වික්ටෝරියානු රජයේ www.careers.vic.gov.au වෙබ් අඩවියේය.

සාර්ථකවන සියළුම අයදුම්කරුවන් තනතුර ලබාදීමට පෙර අපරාධ වාර්තා පරීක්ෂණ, ඇඟිලි සළකුණු පරීක්ෂණ සහ මූල්‍යමය පරීක්ෂණ ඇතුළු ආරක්ෂණ පරීක්ෂා කිහිපයකට යටත්විය යුතුය.